මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| භූගෝල විද්‍යාව | 7 ශ්‍රේණිය | කාලය : පැය 02යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..............................................................................................................................

## I පත්‍රය

- 1 පත්‍රයේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර වරහනින් තෝරා ලියන්න.

1. ග්‍රිනිච් මධ්‍ය දේශාංශය සළකුණු කර ඇති නගරය පිහිටා ඇත්තේ ...............................නම් රටෙහිය.
   (චීනය ,බ්‍රිතාන්‍යය.ජපානය . ඉන්දියාව )
2. ශ්‍රී ලංකාවේ කොළඹ සිට ......................................තුඩුව දක්වා දිග කි.මී 224කි .
   (පේදුරු ,දෙවුන්දර , සංගමන් කන්ද , කුදිරමලෙ )
3. ආරක්ෂක බලකොටුවක් ලෙසට ප්‍රකටව ඇති ශේෂ කන්දක් ලෙස ............................ ට ප්‍රධාන තැනක් හිමි වේ.
   (යාපහුව, දඹදෙණිය, සීගිරිය, ගම්පල )
4. ඩෙල්ෆ්ට් , කයිට්ස් , නාගදීපය වැනි දූපත් පිහිටා ඇත්තේ ..........................................දිස්ත්‍රික්කයේය.
   (පුත්තලම, යාපනය , මඩකලපුව , ත්‍රිකුණාමලය )
5. කුමන කුරුළු අභයභූමිය පිහිටා ඇත්තේ .............................................. පළාතේය.
   (උතුරු, නැගෙනහිර, දකුණ, බටහිර )

ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා අදාළ පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැනෙහි ලියන්න.
(මඩුදේවස්ථානය ,කඳුකර , කොළඹ , මාලදිවයින , ආසියා , කෝට්ටෙ)

6. රුසියාව පිහිටා ඇත්තේ .................................මහද්වීපයේය .
7. ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වශයෙන් .....................................දැක්විය හැකිය .
8. ජාතික උරුමයන් අතර ........................................ස්පෘෂ්‍ය උරුමයන් ලෙස වැදගත්වේ .
9. කඳුවැටි ,සානු , උස්කඳු මුදුන් ,බහුලව දක්නට ලැබෙන්නේ ................................කලාපීය භූ දර්ශන සහිත ප්‍රදේශවලය.
10. ශ්‍රී ලංකාවේ වානිජ අගනගරය වූ ..............................................නෙත් කලාපයේ පිහිටා ඇත.

ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් (නි) යන්න වටාද වැරදි නම් (වැ) යන්න වටාද රවුමක් අඳින්න.

11. ලෝකයේ කුඩාම මහද්වීපය ඔස්ට්‍රේලියා මහද්වීපයයි. නි/වැ

12. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ සමකයට උතුරෙනි . නි/වැ

13. දකුණු ආසියාතික රටවල් අතරින් සාක්ෂරතාව වැඩිම රට ශ්‍රී ලංකාවයි නි/වැ

14. ආඩියා ළිං බහුලවව දක්නට ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේය. නි/වැ

15. පෝෂ්‍යදායි ආහාරවේලක් ලබාගැනිමෙන් පෝෂණය වැඩි දියුණු වේ. නි/වැ

අංක16 සිට 20 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න .

16. සාගර යනු මොනවාදැයි දක්වන්න.

17 . ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙහි වර්ග කි. මී වලින් දක්වන්න.

18. ලංකාවේ ආදීවාසින් වෙසෙන ප්‍රදේශ දෙකක් නම් කරන්න.

19. යාපනයේ පිහිටි ප්‍රධාන දේවස්ථානය කුමක්ද ?

20. ලංකාව හැර දකුණු ආසියානු කලාපයට අයත් රටවල් දෙකක් නම් කරන්න .

(ල-2×20=40)

# II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න වලින් හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01. පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ග්‍රිනිජ් මධ්‍ය දේශාංශය යනු කුමක්ද?

11. ලෝක ආදර්ශගෝලයේ එය වැටී ඇත්තේ කුමන රටක් හරහාද?

111. දේශාංශ රේඛා යනුවෙන් අදහස් වන්නේ කුමක්ද?

1V. ජාත්‍යන්තර දින රේඛාවේ ඇති වැදගත්කමක් ලියන්න.

V. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ කවර අක්ෂාංශ දේශාංශ අතරද?

VI. දකුණු ආසියාවට අයත් විශාලම රට කුමක්ද?

VII. ඉන්දියන් සාගරයට අයත් දූපත් දෙකක් නම් කරන්න.

VIII. ආසියානු කලාපයට අයත් මුහුදක් නම් කරන්න.

(මුළු ලකුණු දෙක බැගින් ලකුණු 16 යි.)

2. 1. පෘථිවි භ්‍රමනය යනු කුමක්ද? (ල- 02 )

11. අධික අවුරුද්දක් යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි ලියන්න. (ල..4 )

111. පෘථිවි ආදර්ශ ගෝලයේ ප්‍රධාන අක්ශාංෂ රේඛා ඇඳ නම් කරන්න. (ල..6 )

3. 1. මහද්වීපයක් යනු කුමක්ද? (ල- 02 )

11. පහත දැක්වෙන මහාද්වීප නම් කරන්න . (ල- 04 )

* ලෝකයේ විශාලතම මහද්වීපය -

* ලෝකයේ කුඩාම මහද් වීපය -

111. ශ්‍රී ලංකාව දූපතක් වීම නිසා ඇති වාසි දෙකක් පැහැදිලි කරන්න. (ල- 06 )

4. 1. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ල-02 )

11. පහත භූ විෂමතා කලාප වලට අයත් භූ ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ල- 04 )

- මධ්‍යම කඳුකරය
- වෙරළබඩ තැනිතලාව -

111. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන මෝසම් වර්ග දෙක නම් කොට ,ඉන් ඒකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල- 06)

5. 1. ශ්‍රී ලංකාව බහු ආගමික සංස්කෘතියක් ඇති රටක් ලෙස හැඳින්වීමට හේතුව කුමක්ද ? (ල- 2 )

11. පහත සඳහන් අපේ උරුමයන් දෙක බැගින් නම් කරන්න. (ල- 4 )

* සපෘෂ්‍ය උරුම -
* අස්පෘෂ්‍ය උරුම -

111. ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් රැක ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල- 6 )

6.

1. ලංකාවේ දක්නට ලැබෙන භූ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල- 3 )

11. වියළි කලාපීය ප්‍රදේශවල ජල හිඟයට එහි වැසියන් අනුගමනය කළ විසඳුම් දෙකක් සඳහන් කරන්න.

(ල- 2 )

111. පරිසරයට හානිකර වූ සංවර්ධන කටයුතු නිසා ඇතිවන හානි දෙකක් දක්වා ඒවාට විසඳුම් දෙකක් ද යෝජනා කරන්න.

(ල- 6 )